**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

**ජ්‍යෙෂ්ඨ ආරක්ෂක සේවා පාලක තනතුරේ (මෙහෙයුම්/ගිනි ආරක්ෂක) නිලධාරීන් වශයෙන් සේවය කිරීම සඳහා සුදුසුකම්ලත් මනා පළපුරුද්දක් සහිත ත්‍රිවිධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායේ නිත්‍ය සේවයේ රාජකාරි කරන ලද ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීමට සලකා බැලීම සඳහා අයදුම්පත් කැඳවනු ලබයි.**

# ජ්‍යෙෂ්ඨ ආරක්ෂක සේවා පාලක තනතුර (මෙහෙයුම්) / ජ්‍යෙෂ්ඨ ආරක්ෂක සේවා පාලක තනතුර (ගිනි ආරක්ෂක)

(කොන්ත්‍රාත් පදනම මත)

## 1.0 කාර්යය / වගකීම්:

- ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත ආරක්ෂාව හා ගිනි හා ආරක්ෂණ පද්ධතීන් සැලසුම් කිරීම, සංවිධානය හා වැඩි දියුණු කිරීම සඳහා වූ මෙහෙයුම් කාර්යයට ආරක්ෂක නිලධාරීන් හා ගිනි ආරක්ෂක උපකරණ යෙදවීමට අවශ්‍ය නායකත්වය, මග පෙන්වීම, පාලනය, පුහුණුව හා අධීක්ෂණය සැපයීම.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයින්ට තම කාර්යයන් ඉටු කිරීමට සුදුසු ආරක්ෂිත වටපිටාවක් ඇති කිරීම, සහතික කිරීම සඳහා සමස්ත ආරක්ෂක මෙහෙයුම් සුරක්ෂිත කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ දේපලවලට ඇති විය හැකි අනතුරුවලින් ඒවා ආරක්ෂා කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරක්ෂාව සහ ගිනි හා ආරක්ෂක කටයුතුවලට අදාලව කළමනාකාරිත්වය විසින් පවරනු ලබන වෙනත් ඕනෑම කාර්යයක් ක්‍රියාත්මක කිරීම.

## 2.0 යෝග්‍යතාවය:

- මනා විනයක් පවත්වා ගනිමින් ගෞරවාන්විතව රාජකාරි කිරීමට ආරක්ෂක නිලධාරීන් විශාල ප්‍රමාණයක කණ්ඩායමක් මෙහෙයවීම හා අභිප්‍රේරණය කිරීමට ඇති හැකියාව සහ ඉහළ නායකත්ව ගුණාංගවලින් යුතු වීම.
- ශ්‍රී ලංකා පොලීසිය හා ත්‍රිවිධ හමුදාව, රජයේ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ, මූල්‍ය ආයතන මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයින් සමඟ එක්ව කටයුතු කිරීමට අවශ්‍ය විශිෂ්ට අන්තර් පුද්ගල සහ සන්නිවේදන කුසලතා පැවතීම.

## 3.0 අවශ්‍ය අවම සුදුසුකම්:

### 3.1 අධ්‍යාපන සුදුසුකම්

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඕනෑම ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් තිබීම.

### 3.2 වයස

2023.11.15 දිනට අවුරුදු 40 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

### 3.3 පළපුරුද්ද

- ත්‍රිවිධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායේ නිත්‍ය සේවයේ නිකැළැල් සහ අඛණ්ඩ සේවයක් සහිත අවම වශයෙන් වසර 22 ක පළපුරුද්ද,
- රෙජිමේන්තු, පාබල හමුදා, පුපුරණ ද්‍රව්‍ය, විනය ආරක්ෂක, මාණ්ඩලික රාජකාරි, විශේෂ බලකා, අවි ආයුධ හෝ ශාරීරික පුහුණු උපදේශක, සහ ගිනි ආරක්ෂක වැනි ක්ෂේත්‍රවල විශේෂඥතාව අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

### 3.4 ත්‍රිවිධ හමුදාවේ/ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායේ දැරූ නිලය

ශ්‍රී ලංකා යුද හමුදාවේ ලුතිනන් කර්නල් (Lieutenant Colonel in SL Army) නිලය, ශ්‍රී ලංකා නාවික හමුදාවේ කමාන්ඩර් (Commander in SL Navy) නිලය, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විංග් කමාන්ඩර් (Wing Commander in SL Air Force) නිලය හෝ ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී (Senior Superintendent of Police in SL Police-STF) නිලය හෝ ඊට ඉහළ නිලයක් දැරූ විශ්‍රාමික නිලධාරියෙකු විය යුතුය.

### 3.5 අනෙකුත් අවශ්‍යතා

රටෙහි ඕනෑම ප්‍රදේශයක ක්ෂේත්‍ර රාජකාරී කිරීමට සෞඛ්‍ය, ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය අයෙකු විය යුතුය.

**අයදුම්පත සමඟ අධ්‍යාපනික සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සනාථ කිරීමට අදාළ සහතිකවල ඡායා පිටපත් යොමු කිරීමට අයදුම්කරුවන් විසින් වග බලා ගත යුතුය. ඉහත ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවක දී ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක.**

## 4.0 සේවා කාලය:

ආරම්භයේ දී වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබන අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අවශ්‍යතාවය හා බඳවා ගනු ලැබූ නිලධාරීන්ගේ සතුටුදායක කාර්ය සාධනය මත පදනම්ව උපරිම වසර තුනක් (03) දක්වා සෑම වසරක් අවසානයේදීම සේවා ගිවිසුම දීර්ඝ කිරීමට සලකා බලනු ඇත.

## 5.0 වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ:

සියලු දීමනා ඇතුළත්ව මසකට රුපියල් 300,000/- ක, බද්දට යටත් වේතනයක් ගෙවනු ලබන අතර වැටුපෙන් 12%කට සමාන මුදලක් සේවක අර්ථසාධක අරමුදලට සහ වැටුපෙන් 3%කට සමාන මුදලක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායකත්ව මුදල් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙවනු ඇත.

## තෝරා ගැනීමේ ක්‍රමය

ලිඛිත පරීක්ෂණයකින් අනතුරුව පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් හෝ සම්මුඛ පරීක්ෂණ එකක් හෝ කිහිපයක් මත පදනම්ව සුදුසු අපේක්ෂකයින් තෝරා ගනු ලැබේ.

## අයදුම්පත්

අයදුම්පතෙහි නියමිත ආකෘති පත්‍රය, **https://www.cbsl.gov.lk/en/careers** යන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

නියමිත ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත් පමණක් ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් වග බලා ගත යුතු අතර, අවශ්‍ය සියලු ලිපි ලේඛන සහිතව නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2023.11.15 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ/මානව සම්පත් වෙත ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

අයදුම්පත් එවීමේ දී "ජ්‍යෙෂ්ඨ ආරක්ෂක සේවා පාලක තනතුර (මෙහෙයුම්) (කොන්ත්‍රාත් පදනම මත)" හෝ "ජ්‍යෙෂ්ඨ ආරක්ෂක සේවා පාලක තනතුර (ගිනි සහ ආරක්ෂක) (කොන්ත්‍රාත් පදනම මත)" යනුවෙන් අයදුම් කිරීමට අපේක්ෂා කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අපේක්ෂිත සුදුසුකම් සම්පූර්ණ කර නොමැති තැනැත්තන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබන අතර අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත්, අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හෝ නියමිත ආකෘතියට අනුව සකස් නොකරන ලද අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සහතිකපත්‍ර පරීක්ෂා කරන අවස්ථාවේ දී අදාළ සහතිකපත්‍රවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් කවර හේතුවක් යටතේ හෝ මෙම තනතුර සඳහා පත් කරගනු නොලැබේ.

තෝරා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසුකමක් වේ.

බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීම, බඳවා ගැනීම කල් දැමීම හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය. බඳවාගැනීමේ නිර්ණායක අනුව සුදුසුකම් ලබන අපේක්ෂකයන් පමණක් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඊළඟ පියවර සඳහා සලකා බලනු ලැබේ.

**අධ්‍යක්ෂ - මානව සම්පත්**
**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01**
**දුරකථන: 0112 - 477330 ෆැක්ස්: 0112 - 477715**